# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2126/8 – 2019 ජූනි 03 වැනි සඳුදා – 2019.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/03/2018/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය, අංක 10/21ඒ, ජයසුන්දර පෙදෙස, ඇල්හේන පාර, මහරගම. (එම්. ඉම්තියාස් මහතා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, ගොහාගොඩ පාර, අංක 599, එච්. එම්. අනුලාවතී මෙනෙවිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

1A – G 30220 – 26 (2019/06)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*මගේ අංකය*: IR/COM/03/2018/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය, අංක 10/21ඒ, ජයසුන්දර පෙදෙස, ඇල්හේන පාර, මහරගම. (එම්. ඉම්තියාස් මහතා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

*ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,*

‘‘ 2016.01.12 දින සිදුවී ඇති රිය අනතුරකට අදළව පවත්වා ඇති විනය පරීක්ෂණයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මීතොටමුල්ල ඩිපෝවේ වැඩ මූලික ලෙස සේවය කර ඇති එම්. ඉම්තියාස් මහතාට ලබා දී ඇති විනය නියෝගයෙන්/දඬුවමෙන් ඒ මහතාට අසාධාරණයක් සිදුවී තිබේ ද? අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද’’ යන්න පිළිබඳ වේ.’’

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

064 - 511

---

*මගේ අංකය*: IR/COM/05/2018/80.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා බැංකු සේවක සංගමය - ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛාව, ‘‘බැන්ක් යූනියන් ’’ කලම්බු, අංක 507/1, නුවර පාර, පට්ටිය, කැලණිය. (කේ. ඩී. ශාන්ත විපුලසේන මහතා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රධාන කාර්යාලය, අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, යටිවාවල, අරලිය උයන, ‘‘මිගදාය’’, අංක 339/01/ඩී/2, එල්. ආර්. සුමතිපාල මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/05/2018/80.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා බැංකු සේවක සංගමය - ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛාව, ‘‘බැන්ක් යූනියන් ’’ කලම්බු, අංක 507/1, නුවර පාර, පට්ටිය, කැලණිය. (කේ. ඩී. ශාන්ත විපුලසේන මහතා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රධාන කාර්යාලය, අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

‘‘ අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛාවේ කළමනාකරු වශයෙන් සේවය කළ කේ. ඩී. ශාන්ත විපුලසේන මහතාට විනය නියෝගයකට අනුව සේවා තත්ත්වයෙන් පහත හෙළීම, උපයා ගත් වැටුප අඩු කිරීම, තරයේ අවවාද කිරීම, වර්ෂ 05ක් සඳහා උසස්වීම් හා විදේශ ශිෂ්‍යත්ව ලබා නොදීම ඇතුළු දඬුවම් ලබාදීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.’’

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

---

06 - 512

*මගේ අංකය*: IR/COM/04/2016/89.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආර්. එම්. එම්. ආර්. එල්. එස්. හලංගොඩ මිය, අංක 6 බී, කටාන පාර, හේනමුල්ල, කොච්චිකඩේ.

2. ආර්. එම්. ඩී. එස්. එස්. රාජපක්ෂ මයා, අංක 123, පහළ බෝම්රිය, කඩුවෙල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අංක 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/04/2016/89.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආර්. එම්. එම්. ආර්. එල්. එස්. හලංගොඩ මිය, අංක 6බී, කටාන පාර, හේනමුල්ල, කොච්චිකඩේ.

2. ආර්. එම්. ඩී. එස්. එස්. රාජපක්ෂ මයා, අංක 123, පහළ බෝමිරිය, කඩුවෙල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අංක 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

'' ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවයේ නියුතු ආර්. එම්. එම්. ආර්. එල්. එස්. හලංගොඩ මියට සහ ආර්. එම්. ඩී. එස්. එස්. රාජපක්ෂ මයාට 2013.02.18 දින සිට බලපැවැත්වෙන පරිදි ලබාදුන් උසස්වීම් 2013.08.14 දින සිට අත්හිටුවීම තුළින් අසාධාරණයක් සිදුවී තිබේද? එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුනට ලැබිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 513

---

*මගේ අංකය*: IR/COM/05/2016/170.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
පී. ඩී. පී. සිසිල කුමාර මයා, අංක බී-12, නිවාස 500 යෝජනා ක්‍රමය, කිරිවන්දල, පුවක්පිටිය, අවිස්සාවේල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
ලංකා විදුලිබල මණ්ඩලය, අංක 644, ශ්‍රී ජයවර්ධනපුර මාවත, ඇතුල්කෝට්ටේ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1, පී. නවරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/05/2016/170.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. ඩී. පී. සිසිල කුමාර මයා, අංක බී-12, නිවාස 500 යෝජනා ක්‍රමය, කිරිවන්දල, පුවක්පිටිය, අවිස්සාවේල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 644, ශ්‍රී ජයවර්ධනපුර මාවත, ඇතුල්කෝට්ටේ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරන පී. ඩී. පී. සිසිල කුමාර මයා ඇතුළු 07 දෙනෙකු 2013.01.31 දින ඉංගිරිය පාරිභෝගික සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයට අයත් 33000 අධිසැර රැහැන් මාර්ග නඩත්තු කටයුත්තකට සහභාගී වී සිටිය දී එස්. වී. එස්. රත්නසිරි සේවකයා මියයාම හා හේමාල් ජගත් කුමාර සේවකයා අනතුරට පත්වීම යන සිදුවීම සම්බන්ධයෙන් පැවති විනය පරීක්ෂණයෙන් පැමිණිලිකරු ඇතුළු ඉහත කී 07 දෙනාට විනය දඬුවම් ලබාදීමෙන් අනතුරුව එම දඬුවමට විරුද්ධව අභියාචනා කිරීමෙන් පසු අනෙකුත් 06 දෙනාගේ දඬුවම් ඉවත් කර සහන ලබාදී පී. ඩී. පී. සිසිල කුමාර මයාට පමණක් දඬුවම් ලිහිල් නොකිරීම නිසා අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදුවී තිබේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳ වේ.”

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 514

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.